පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக்கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය - 2016

(2017 දෙසැම්බර්)

ඉතිහාසය VII - (HG 7)

පොදුරාජ්‍ය මණ්ඩලයේ ඉතිහාසය

කාලය පැය **තුන (03)**යි.

යටත් පිරිසෙයින් **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මගින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළස **(12)** කි.

---

## පළමු වන කොටස

1. 15 වන හා 16 වන සියවස්වල බ්‍රිතාන්‍ය දේශ ගවේෂණය සඳහා යොමු කළ සාධක පරීක්ෂා කරන්න.

2. පළමු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය නිර්මාණය කිරීමෙහිලා ටියුඩර් රාජවංශයේ දායකත්වය සාකච්ඡා කරන්න.

3. 1583-1783 අතර කාලය තුළ බ්‍රිතාන්‍යයන් සිය අධිරාජ්‍යය පිහිටුවීමේ දී අනුගමනය කළ උපායමාර්ග විභාග කරන්න.

4. "ඇමෙරිකානු විප්ලවය බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයේ හැරවුම් ලක්ෂය ලෙස සැලකේ" මෙම ප්‍රකාශය සමඟ ඔබ කොතෙක් දුරට එකඟ වන්නේද?

## දෙවන කොටස

5. 18 වන සියවස තුළ බ්‍රිතාන්‍යය හා ප්‍රංශය අතර යටත්විජිත තරඟයට බලපෑ හේතූන් කවරේද?

6. 17 වන හා 18 වන සියවස්වල යටත්විජිත ඇතිකිරීමේ ක්‍රියාවලියේදී නෙදර්ලන්තය හා බ්‍රිතාන්‍ය අතර සබඳතාවය විකාශය වූ ආකාරය පෙන්වා දෙන්න.

7. 18 වන සියවසේ පැසිපික් සාගරයේ දේශ ගවේෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් කැප්ටන් ජේම්ස් කුක් ගේ භූමිකාව සාකච්ඡා කරන්න.

8. "1815-1870 අතර කාලය තුළ ලෝකයේ කම්හල මහා බ්‍රිතාන්‍යය විය." මෙම ප්‍රකාශය විමසන්න.

තුන්වන කොටස

9. ඕස්ට්‍රේලියාවේ හා නවසීලන්තයේ බ්‍රිතාන්‍ය යටත්විජිතවාදී ක්‍රියාවලියේ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

10. වික්ටෝරියානු අවධියේදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ව්‍යාප්ත වූ ආකාරය පෙන්වා දෙන්න.

11. ආසියාවේ යටත්විජිත විරෝධී ව්‍යාපාර බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට බලපෑ ආකාරය සාකච්ඡා කරන්න.

12. පහත දැක්වෙන මාතෘකා අතුරින් <u>දෙකක්</u> පිළිබඳව ලුහුඬු ඓතිහාසික සටහන් ලියන්න.

(අ) බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව

(ආ) සූවස් ඇළ

(ඇ) බෙන්ජමින් ඩිස්රෙයලි

(ඈ) 1926 අධිරාජ්‍ය සමුළුව